# කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

2018.01.01 – 2018.03.31

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
මැතිවරණ කොමිෂන් සභාව

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்
தேர்தல் ஆணைக்குழு

Election Commission of
Democratic Socialist Republic of Sri Lanka

## මැතිවරණ කොමිෂන් සභාවේ 2018 වර්ෂයේ පළමුවන කාර්තුවෙහි කාර්ය සාධන වාර්තාව (2018.01.01 – 2018.03.31)

### 1. මැතිවරණ කොමිෂන් සභාව

අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත මැතිවරණ කොමිෂන් සභාව සඳහා පත්කරන ලද සභාපති ඇතුළු සාමාජිකයින් 2015.11.17 වන දින රාජකාරි භාර ගැනීමෙන් පසු මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත විය. කොමිෂන් සභාවේ සංයුතිය පහත පරිදි වේ.

මහින්ද දේශප්‍රිය මහතා (සභාපති)

ජනාධිපති නීතිඥ එන්.ජේ. අබේසේකර මහතා (සාමාජික)

මහාචාර්ය එස්. රත්නජීවන් එච්. හූල් (සාමාජික)

### 2. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර

**"සර්වජන ඡන්ද බලය සුරකින දේශයක්"** යන්න කොමිෂන් සභාවේ දැක්මයි.

එකී දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා **"ජනතා පරමාධිපත්‍ය, සර්වජන ඡන්ද බලය හා සැබෑදී ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියළු පාර්ශ්ව දැනුවත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වාසනීය මැතිවරණ ක්‍රියාවලියක් කාර්යක්ෂමව හා සඵලතාවයෙන් යුතුව මෙහෙය වීම."** යනුවෙන් මෙහෙවර ප්‍රකාශය සකස් කර ඇත.

**අරමුණු හා පරමාර්ථ**

- සුදුසුකම් ඇති සියලුම පුරවැසියන්ට නිදහස් හා සාධාරණ ලෙස පවත්වනු ලබන්නා වූ ඡන්ද විමසීම්වලදී නොබියව, නිදහසේ, විශ්වාසයක් ඇතිව සිය ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව සැලසීම.
- ඡන්දය පාවිච්චි කිරීම තමන් වෙත ඇති අන්සතු කළ නොහැකි අයිතියක් බවත් තමන් මැතිවරණ ක්‍රියාවලිය තුළ ක්‍රියාකාරී ලෙස සහභාගී වන බවත් අවබෝධ කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ඡන්ද විමසීම් කාලසීමාව තුළදී සියලු ඡන්ද අපේක්ෂකයන්ට සම හා සාධාරණ අවස්ථාවන් ලැබෙන පරිදි ක්‍රියාකිරීමට පියවර ගැනීම.
- සියලුම ඡන්ද විමසීම්වලට පූර්වයෙහි සුදුසකම් ලත් සියලු පුරවැසියන් ඇතුළත් වූ යථාවත් කරන ලද ඡන්දහිමි නාමලේඛනයක් සකස් කිරීම.
- සාමාජික වශයෙන් ආන්තික ලෙස ජීවත්වන සියලු පුරවැසියෝ විශ්වාසවන්ත ලෙස හා ප්‍රමාණවත් ලෙස ඡන්ද විමසීම් ක්‍රියාවලියට සහභාගී කරවීමට අවශ්‍ය පියවර ගැනීම.

- මැතිවරණ ක්‍රියාවලිය දක්ෂ ලෙස හා පාරදෘශ්‍ය ලෙස පරිපාලනය කිරීම.
- ඡන්ද විමසීම් ක්‍රියාවලියට හා මැතිවරණ කොමිෂන් සභාවට අදාළ දත්ත හා තොරතුරු පාර්ශ්වකරුවන්ට ලබාගැනීමේ පහසුකම කාලානුරූපව හා ප්‍රමාණවත් ලෙස සලසනු ලැබීම.

## 3. කොමිෂන් සභාවේ කාර්යභාරය

මැතිවරණ කොමිෂන් සභාව 2015.11.17 වන දින ස්ථාපිත කිරීමෙන් පසුව එතෙක් මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රමුඛ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ කටයුතු කොමිෂන් සභාව යටතට පත්විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම, කොමිෂන් සභාවේ මූලික කාර්යභාරය වේ. ඒ අනුව ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම, පාර්ලිමේන්තු මැතිවරණය , පළාත් සභා ඡන්ද විමසීම් , පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් හා ජනමත විචාරණය යනාදී ඡන්ද විමසීම් නිදහස් හා සාධාරණව පැවැත්වීමද ඊට අදාළව වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ද සිදුකළ යුතුවේ. මෙම ව්‍යවස්ථාපිත කටයුතුවලට අමතර වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී පුරප්පාඩු පිරවීම, පළාත් සභා සභිකධුරවල පුරප්පාඩු පිරවීම හා පළාත් පාලන ආයතනවල සභිකධුරවල පුරප්පාඩු පිරවීම ද දේශපාලන පක්ෂ පිළිගැනීම හා ලියාපදිංචි කිරීමද යන ව්‍යවස්ථාපිත කාර්යයන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

## 4. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම්

මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් අවශ්‍යතාව අනුව සතියකට වරක් බැගින් පැවැත්වේ. 2017 වර්ෂය සඳහා රැස්වීම් 48ක් පවත්වන ලදී. 2018 මුල් කාර්තුව සඳහා පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව 15කි. කොමිෂන් සභා රැස්වීම් පැවැත්වීමේදී පැන නඟින මූලික ප්‍රශ්නය වන්නේ සන පූර්ණය පිළිබඳ ප්‍රශ්නයයි.එයට හේතුව නම් මුළු සාමාජික සංඛ්‍යාව ම සණ පූර්ණය වශයෙන් ද සඳහන් කර තිබීමයි. මෙම සණ පූර්ණය වෙනස් කිරීම පිණිස අවශ්‍ය මූලික පියවර ගෙන ඇතත් එය තවදුරටත් ප්‍රමාද වන බව පෙනේ. මේ නිසා කවර හෝ සාමාජිකයෙකු විදේශගතව හෝ කොළඹින් බැහැරවන අවස්ථාවලදී skype තාක්ෂණය හරහා ඔහු සම්බන්ධ කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 5. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය, මාණ්ඩලික නිලධාරීන් වන සභාපති හා සාමාජිකයින් , ලේකම්, මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (ශ්‍රී ලං.ප.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ (ශ්‍රී ලං.ග.සේ.) නිලධාරීන්, අධ්‍යක්ෂ (නීති), ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ (ශ්‍රී ලං.තො.ස.තා.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා සැලසුම් සේවයේ ශ්‍රී ලං.සැ.සේ.) නිලධාරීන්, රාජ්‍ය කළමනාකරණ සහකාර (රා.ක.ස.සේ.) අධි ශ්‍රේණියේ නිලධාරීන්, භාෂා පරිවර්තක නිලධාරීන්ගෙන් හා මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලයේ රාජ්‍ය

කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්, තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන්, ලේඛන සහකාරවරුන්, කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගෙන් සමන්විත වේ. ඒ අනුව 2018.03.31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | සංඛ්‍යාව |
|---|---|
| මාණ්ඩලික නිලධාරීන්<br>(මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයින් හැර අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් ඇතුළුව) | 51 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 383 |
| සංවර්ධන නිලධාරී | 27 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 14 |
| ලේඛන සහකාර | 51 |
| පිළිගැනීමේ නිලධාරී | 01 |
| කාර්යාල කාර්ය සහයක | 175 |
| රියදුරු | 46 |
| රිය ශෝධක | 01 |

මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේ, අදාළ කාල පරිච්ඡේදය (2018.01.01 - 2018.03.31) තුළ සිදුවූ ආයතනික කටයුතු පහත පරිදි සාරංශ කොට දක්වා ඇත.

ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාවේ මාණ්ඩලික නිලධාරීන්ගේ උසස් කිරීම්, නව පත්කිරීම්, ස්ථාන මාරු, නිදහස් කිරීම් හා විශ්‍රාම යෑම් පහත පරිදි වේ.

| | සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| වැඩ බැලීමට පත් කිරීම් | ශ්‍රී ලං.ප.සේ. (I ශ්‍රේණිය) | 01 |
| | ශ්‍රී ලං.ප.සේ. (IIIශ්‍රේණිය) | 01 |
| නව පත්කිරීම් | ශ්‍රී ලං.තො.ස.තා.සේ. | 01 |
| කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු කිරීම් | ශ්‍රී ලං.ප.සේ. (I ශ්‍රේණිය) | 01 |
| | ශ්‍රී ලං.ප.සේ. (IIIශ්‍රේණිය) | 01 |
| නිදහස් කිරීම් | ශ්‍රී ලං.ප.සේ. (I ශ්‍රේණිය) | 01 |
| 2018.03.31 දිනට විශ්‍රාම යෑම් | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය) | 01 |
| | රා.ක.ස.සේ. (අධි ශ්‍රේණිය) | 01 |

මැතිවරණ කොමිෂන් සභාවේ මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලයේ ස්ථාන මාරු කිරීම්, නිදහස් කිරීම්, විශ්‍රාම යෑම්, ඉල්ලා අස්වීම්, සේවය හැරයාම් හා නව බඳවාගැනීම් පහත සඳහන් පරිදි සිදු කරන ලදී.

| | සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| මැතිවරණ කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු කිරීම් | රාජ්‍ය කළමනාකරණ සහකාර | 08 |
| මැ.කො.සභාවෙන් නිදහස් කිරීම් - අනුප්‍රාප්තිකයන් රහිතව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| මැ.කො.සභාවෙන් නිදහස් කිරීම් - අනුප්‍රාප්තිකයන් සහිතව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 |
| 2018.03.31 දිනට විශ්‍රාම යෑම් | රාජ්‍ය කළමනාකරණ සහකාර | 05 |
| | කාර්යාල සේවක සේවය | 03 |
| රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු සඳහා නිදහස් කිරීම් | කාර්යාල සේවක සේවය | 01 |
| සේවයෙන් ඉල්ලා අස්වීම් | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| මියයාම් | කාර්යාල සේවක සේවය | 01 |
| නව බඳවා ගැනීම් | රියදුරු සේවය | 05 |

## 6. දේශීය හා විදේශීය පුහුණු කිරීම් හා නිලවාරිකා

**දේශීය පුහුණුවීම්.**

- මෙම කාලය තුළ ආයතනික දේශීය පුහුණුවීම් ලබාදීමට අවකාශ නොමැති වූයේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් කටයුතු සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයන් නිරතව සිටි හෙයිනි.
- දේශීය පුහුණුවීම් වශයෙන් මෙම කාලය තුළ සිදු කරනු ලැබුවේ ඡන්ද විමසීම් කටයුතු සඳහා යොදාගනු ලබන තේරීම්භාර නිලධාරීන්, සහකාර තේරීම්භාර නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, ගණන් කිරීමේ නිලධාරීන්, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් හා අනෙකුත් කාර්යමණ්ඩල පුහුණු කිරීමය. ප්‍රධාන කාර්යාලය මගින් මෙන්ම දිස්ත්‍රික් කාර්යාල මගින් මෙම පුහුණු කටයුතු සංවිධානය කරන ලදී.

**විදේශීය පුහුණු කිරීම්.**

මැතිවරණ කොමිෂන් සභාව විසින් එහි මාණ්ඩලික නිලධාරීන්ට හා අනුයුක්ත කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට සලසන ලද විදේශ ශිෂ්‍යත්ව හා පුහුණුවීම් පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| කාලය | සහභාගී වූ පිරිස | රට | වැඩසටහන |
|---|---|---|---|
| 2018.02.26 සිට 2018.03.03 දක්වා | ටී.ඒ.සී.එන්.තලංගම මහතා, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්<br>ඩබ්.ඒ.එල්.වික්‍රමාරච්චි මහතා, සහකාර මැතිවරණ කොමසාරිස්<br>ශ්‍රීන් යාපා බොරලැස්ස මහතා, සහකාර මැතිවරණ කොමසාරිස්<br>පී.එස්. පතිරණ මහතා, සහකාර මැතිවරණ කොමසාරිස් | ඉන්දියාව | Capacity Building for Voter Registration for Election Officials (BIMSTEC Member Countries) |

**විශේෂ කටයුතු**

- මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු අවුරුදු උපායමාර්ගික සැලැස්මේ සඳහන් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හරහා ශිෂ්‍ය ප්‍රජාව හා විවිධ ආයතනවල/ සංවිධානවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීමට සහාය වීම. ඒ පිළිබඳව ප්‍රගතිය විමර්ශනය කිරීම.

- ශ්‍රී ලාංකික ජනතාවට සර්වජන ඡන්ද බලය ලැබීමේ 85 වන සංවත්සරය සැමරීමේ උත්සවය නිමිත්තෙන් එළි දක්වන ලද ශාස්ත්‍රීය ලිපි ඇතුළත් පොතේ ඉංග්‍රීසි/ දෙමළ භාෂා මුද්‍රණයට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- 2018 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත යැවීම. පළමු කාර්තුවේ ප්‍රගති සමාලෝචනය සිදුකිරීම.

- මැතිවරණ කාර්යයන් සඳහා රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ තොරතුරු පරිගණක ගත කිරීම හා දිස්ත්‍රික් අවශ්‍යතාව පරිදි මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් අනුයුක්ත කිරීම. විශේෂ සම්බන්ධීකරණ සහකාර තේරීම්භාර නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා උපදෙස් පන්ති පැවැත්වීම.

- මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාධ්‍ය උපමාන අනුගමනය කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාව පිළිබඳව, රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන ප්‍රධානීන්, නිත්‍ය හා විකල්ප නියෝජිතයන්, ප්‍රමුඛ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය ප්‍රධානීන් දැනුවත් කිරීමේ මාධ්‍ය සාකච්ඡා 03ක් ද, මාධ්‍ය උපමාන බලාත්මක කිරීම පිළිබඳ වූ පැමිණිලි සම්බන්ධ හා සෙසු කරුණු පිළිබඳ මාධ්‍ය සාකච්ඡාවක් ද 2018.02.10 දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පිළිබඳව දැනුවත් කිරීමේ මාධ්‍ය සාකච්ඡාවක් ද පවත්වන ලදී.

- සියලු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ආවරණය වන පරිදි පසුගිය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව උගත් පාඩම් හා නිර්දේශ පිළිබඳ සාකච්ඡා මාලාවක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

## 7. 2018.01.01 සිට 2018.03.31 දක්වා මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද ව්‍යවස්ථාපිත හා අනෙකුත් රාජකාරි

**ව්‍යවස්ථාපිත රාජකාරි**

(i) පිළිගත් දේශපාලන පක්ෂවල නම් දැක්වෙන ගැසට් නිවේදනය අංක 2050/17 හා 2018.01.20 දිනැතිව නිකුත් කරන ලද අතර පළාත් පාලන ඡන්ද විමසීම පැවැත්වීම නිසා හා ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීම් කටයුතු අවසන් නොවීම නිසා දේශපාලන පක්ෂ පිළිගැනීම සඳහා අයඳුම්පත් කැඳවීම මේ වන තෙක් සිදු කර නැත.

(ii) <u>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2018</u>

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් කටයුතු 2017 වර්ෂය තුළ පැවැත්වීම සම්බන්ධයෙන් අවශ්‍ය නීති රීති සංශෝධන සිදු කළ ද, ඊට අදාළ සංස්ථාපන ගැසට් පත්‍රයේ පළ නොකිරීම නිසා එය කල්යාමේ ප්‍රවණතාවක් දක්නට තිබුණි. කෙසේ වුවද, මේ පිළිබඳව ජනතා සංවිධාන හා මහජනයා තුළ අප්‍රසාදයක් ගොඩනැගෙමින් පැවති අතර ජනමාධ්‍ය, සිවිල් සංවිධාන හා මහජනයා විසින් මේ පිලිබඳව කරුණු ඉදිරිපත් කරමින් ඡන්ද විමසීම පැවැත්වීම සඳහා බලපෑම් කරන ලදී. මේ අනුව රජය විසින් පළාත් පාලන ආයතන සංස්ථාපන ගැසට් පත්‍රය අංක 2013/29 හා 2017.04.07 දිනැතිව පළ කරන ලද අතර එම ගැසට් පත්‍රය අංක 2025/35 හා 2017.06.30, අංක 2043/56 හා 2017.11.02 දැනැති ගැසට් පත්‍ර මගින් පළ කරන ලදී. මේ අනුව නාමයෝජනා දැන්වීම 2017.11.27 දින තේරීම්භාර නිලධාරීන් විසින් පළ කරන ලදී. මේ සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ කරුණු දක්වන ලද හෙයින් ඒ වන විට ගැටලු සහගත නොවූ පළාත් පාලන ආයතන සඳහා නාමයෝජනා දැන්වීම පළ කරන ලදී. ඒ අනුව නාමයෝජනා භාර ගැනීම 2017.12.11 සිට 2017.12.14 දින දක්වා සිදු කිරීමට තීරණය කරන ලදී. ඡන්ද විමසීමට අදාළව සිදුකළ යුතු ව්‍යවස්ථාපිත කටයුතු පහත සඳහන් දින වකවාණු තුළ සිදු කරන ලදී.

**නාම යෝජනා අදියර I**

| | | |
|---|---|---|
| නාමයෝජනා දැන්වීම | - | 2017.11.27 |
| නාම යෝජනා භාර ගැනීම | - | 2017.12.11 - 14 |
| තැපැල් ඡන්ද | - | 2017.11.27 - 2017.12.15 |
| බලයලත් නියෝජිතයින් පත් කිරීම | - | 2017.12.08 පැය 8.30ට පෙර |
| තරුණයාගේ වයස් සීමාව | - | 1995.05.31 – 1982.12.14 |

**නාම යෝජනා අදියර II**

| | | |
|---|---|---|
| නාමයෝජනා දැන්වීම | - | 2017.12.04 |
| නාම යෝජනා භාර ගැනීම | - | 2017.12.18 - 121 |
| තැපැල් ඡන්ද ඉල්ලුම්පත් භාරගැනීම | - | 2017.12.01 - 2017.12.22 |
| බලයලත් නියෝජිතයින් පත් කිරීමේ කාල සීමාව | - | 2017.12.15 පැය 8.30ට |

ඡන්ද විමසීමේ දැන්වීම - 2017.12.26
ඡන්ද විමසීම් දිනය - 2018.02.10 (දින 47)

මේ අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව සිදු කළ යුතු කාර්යයන් සඳහා පහත සඳහන් පරිදි දින නියම කරන ලදී.

| | | |
|---|---|---|
| තැපැල් ඡන්ද නිකුත් කිරීමේ දැන්වීම | - | 2017.12.23 |
| තැපැල් ඡන්ද සහතික කිරීම | - | 2018.01.10 |
| තැපැල් ඡන්ද නිකුත් කිරීම | - | 2017.01.12 |
| තැපැල් ඡන්ද ලකුණු කිරීම | - | 2018.01.22/25/26 සහ 2018.02.01/02 |
| නිල ඡන්ද දැන්වීම්පත් බෙදීම. | - | 2018.02.14 දින මධ්‍යම රාත්‍රී 12ට පෙර |
| තැපැල් කාර්යාලයට භාර දීම | - | 2018.01.18 (දින 17) |
| විශේෂ බෙදීම | - | 2018.01.28 |
| ප්‍රචාරණ කටයුතු කිරීමෙන් වැලකී සිටීමේ නිහඬ කාල සීමාව | - | 2018.02.07 වන දින මධ්‍යම රාත්‍රියේ සිට 2018.02.10 දින ඡන්ද විමසීම අවසන් වන තෙක් |
| ඡන්ද විමසීම | - | 2018.02.10 පෙරවරු 7.00 - පස්වරු 4.00 දක්වා |

පෙර පැවති මධ්‍යගත ඡන්ද ගණන් කිරීම වෙනුවට ඡන්ද ගණන් කිරීම ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානවලදී හෝ කොට්ඨාසයේ ඡන්ද මධ්‍යස්ථාන සියල්ලේම ඡන්ද පෙට්ටි කොට්ඨාසයේ එක් ඡන්ද මධ්‍යස්ථානයකට ගෙනැවිත් වෙන වෙනම ගණන් කිරීම සිදු කරන ලදී.

අදියර දෙකෙහිදී නාමයේජනා පත්‍ර (දේශපාලන පක්ෂවලින් හා ස්වාධීන කණ්ඩායම්වලින් භාරදී තිබූ අතර එම නාමයෝජනා පත්‍ර කිහිපයක් විධිවිධානවලට අනනුකූල වීම නිසා ප්‍රතික්ෂේප කරන ලදී. ඒ පිළිබඳව හා අපේක්ෂකයන්ගේ නම් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථා පිළිබඳව අගතියට පත් වූ පාර්ශවයන් අධිකරණ ක්‍රියාමාර්ග 54ක් ගෙනතිබූ අතර ඇල්පිටිය ප්‍රාදේශීය සභාවට අදාළ පෙත්සම හැර අනෙකුත් පෙත්සම් 53ක්ම ඡන්ද විමසීමේ දිනට පෙර ගරු අධිකරණය විසින් නිශ්ප්‍රභා කර ඇත.

මේ අනුව 2018.02.10 වන දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම දිවයින පුරා පළාත් පාලන ආයතන 340ක (ඇල්පිටිය ප්‍රාදේශීය සභාව හැර) පවත්වන ලදී. ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම අධිකරණමය කරුණු හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. ඡන්ද විමසීම සාමකාමීව හා විශේෂ බලපෑම්වලින් තොරව සිදුවිය. නියමිත පරිදි ඒ ඒ දිස්ත්‍රික් හා පළාත් පාලන ආයතනවල තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද ගණන් කිරීමෙන් පසු ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරන ලදී. ජාතික මට්ටමින් ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමේ යම් ප්‍රමාදයක් සිදු වූ අතර එයට හේතු වුයේ ඡන්ද මධ්‍යස්ථාන මට්ටමින් ප්‍රතිඵල පරිගණකගත කිරීමේදී මුහුණපෑමට සිදු වූ

තාක්ෂණික දෝෂ නිසාත්ය. කෙසේ වුවද සමස්තයක් වශයෙන් බලනවිට වෙනස් වූ ඡන්ද ක්‍රමයක් යටතේ, මුළු දිවයිනම ආවරණය වන පරිදි සියලුම ආකෘති පත්‍ර හා ඡන්ද පත්‍රිකා පළාත් පාලන ආයතන වශයෙන් වෙන් වෙන්ව සකස් කරගෙන පවත්වන ලද මෙම ඡන්ද විමසීම නව අත්දැකීමක් විය. එමෙන්ම කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසුව පැවැත් වූ පළමු ඡන්ද විමසීම ද මෙය වේ. එසේම පැවැති සියලුම බාධක ජයගෙන නිදහස් හා සාමකාමී ඡන්ද විමසීමක් ඉතා කෙටි කාලයක් තුළ පැවැත්වීමට හැකිවීම මැතිවරණ කොමිෂන් සභාව ලද ජයග්‍රහණයක් සේ සැලකිය හැකිය.

ඡන්ද විමසීම අවසන් වූ පසුව මැතිවරණ කොමිෂන් සභාව විසින් පහත සඳහන් රජයේ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කරන ලදී.

| **ගැසට් අංකය හා දිනය** | | **විස්තරය** |
|---|---|---|
| 2059/83 (2018.02.24) | - | එක් එක් පළාත් පාලන ආයතනයට අදාළ වැඩියෙන් සිටින සභිකයින් සංඛ්‍යාව ඇතුළත් ගැසට් පත්‍රය. |
| 2060/22 (2018.02.28) | - | සියලුම කොට්ඨාස ප්‍රතිඵල මැතිවරණ වෙබ් අඩවියේ හා පළාත් පාලන ආයතනවල හා ග්‍රාම නිලධාරි කාර්යාල වල ප්‍රසිද්ධ කර ඇති බව දැන්වීම. |
| 2060/23 (2018.02.28) | - | එක් එක් පළාත් පාලන ආයතනයට අදාළව දේශපාලන පක්ෂ හා ස්වාධින කණ්ඩායම් වලට හිමි සභිකධුර සංඛ්‍යාව දැක්වෙන තේරීම්භාර නිලධාරිගේ ප්‍රකාශය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල, පළාත් පාලන ආයතනවල හා මැතිවරණ කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇති බව දැන්වීම. |
| 2061/42 (2018.03.09) | - | තෝරා පත් කරගත් හා තෝරා එවා ඇති සභිකයින් ප්‍රසිද්ධ කිරීම. (මහනුවර හැර ඉතිරි දිස්ත්‍රික්ක) |
| 2062/15 (2018.03.13) | - | තෝරා පත් කරගත් හා තෝරා එවා ඇති සභිකයින් ප්‍රසිද්ධ කිරීම. (මහනුවර දිස්ත්‍රික්කය) |
| 2062/51 (2018.03.17) | - | නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, උපසභාපති පත් කිරීම. (පළාත් පාලන ආයතන 15කට අදාළව) |
| 2063/01 (2018.03.19) | - | තෝරා එවා ඇති සභිකයින් ප්‍රසිද්ධ කිරීම. (ශ්‍රී.ල.පො.පෙ. සභිකයින් කොළඹ මහ නගර සභාවට අදාළ) |
| 2063/41 (2018.03.22) | - | නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, උපසභාපති පත් කිරීම. (පළාත් පාලන ආයතන 93කට අදාළව) |

2066/05 (2018.03.26) - නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, උපසභාපති පත් කිරීම. (පළාත් පාලන ආයතන 51කට අදාළව)

2064/42 (2018.03.29) - පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ සභිකයින්ගේ නම් ඇතුළත් ගැසට් පත්‍රයේ දිනය සංශෝධනය කිරීම.

2064/43 (2018.03.29) - කැකිරාව ප්‍රාදේශීය සභාවේ සභිකයින්ගේ නම් ඇතුළත් ගැසට් පත්‍රයේ දිනය සංශෝධනය කිරීම.

2064/44 (2018.03.29) - නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, උපසභාපතිපත් කිරීම. (පළාත් පාලන ආයතන 7කට අදාළව)

2065/12 (2018.04.03) - ගහඉහළකෝරළේ හා හපුතලේ ප්‍රාදේශීය සභාවල එක්සත් ජනතා නිදහස් සන්ධානයට අදාළ තෝරා එවා ඇති සභිකයින් ප්‍රසිද්ධ කිරීම.

2066/12 (2018.04.10) - බෙන්තර, බලපිටිය හා ආණමඩුව ප්‍රාදේශීය සභාවල සභාපති, උපසභාපති පත් කිරීම.

2067/26 (2018.04.19) - බේරුවල ප්‍රාදේශීය සභාවල ජනතා විමුක්ති පෙරමුණට අදාළ තෝරා එවා ඇති සභිකයා ප්‍රසිද්ධ කිරීම.

ගහඉහළකෝරළේ, හපුතලේ හා බේරුවල ප්‍රාදේශීය සභාවල කාන්තාවන් හා කොළඹ මහ නගර සභාවේ තෝරා යැවිය යුතු කාන්තා සභිකයන් එක් අයකු බැගින් හෝ දෙදෙනෙකු බැගින් අදාළ දේශපාලන පක්ෂ විසින් මාර්තු 31 දින තෙක් එවා නොතිබූ බැවින් එම නම් අප්‍රේල් මස මුල් සතියේ එවනු ඇතැයි අපේක්ෂිතය. එසේම සභිකයන් 50%ක් හෝ එයට වඩා එක්පසකට හිමිව ඇති බෙන්තර, බලපිටිය හා ආණමඩුව යන ප්‍රාදේශීය සභාවල සභාපති/ උප සභාපතිවරයන් නම් කිරීමට ද අදාළ පක්ෂය මාර්තු 31 තෙක් ක්‍රියාකර නැති බැවින් එම ගැසට් නිවේදනය නිකුත් කිරීම ප්‍රමාද වී තිබේ.

2018.02.10 දින පැවති ඡන්ද විමසීමට අදාළ සවිස්තර වාර්තාවක් සැකසීමට පියවර ගනු ලබන අතර එයට පෙර අතුරු වාර්තාවක් 2018 අප්‍රේල් මස තුළ නිකුත් කිරීමට අපේක්ෂිතය.

(iii) <u>2018 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය.</u>

❖ මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි, 2018.02.10 දින පවත්වන ලද, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා යොදා ගන්නා ලද 2017 ඡන්ද හිමි නාමලේඛනයේ එකම ජාතික හැඳුනුම්පත් අංකයක් යටතේ සිදුව ඇති බහු ලියාපදිංචිය සම්බන්ධයෙන් කටයුතු සිදුකරන ලදි, ඒ අනුව එකම ජාතික හැඳුනුම්පත් අංකයක් යටතේ සමාන නම් සහිත පුද්ගලයින් 6092 ක් ලේඛන පරික්ෂාව (ElectionS පරිගණක වැඩසටහන) අනුව හඳුනාගත් අතර, එම තැනැත්තන්ට ඡන්දය භාවිතා කිරිමට තමන් කැමති එක් ස්ථානයක් දන්වා එවන ලෙස ඡන්දය

ලියාපදිංචි වී ඇති ස්ථාන (දිස්ත්‍රික්ක) දෙකටම ලිපි යොමු කරන ලදි. එසේම එකම ජාතික හැඳුනුම්පත් අංකයක් යටතේ **අසමාන** නම් සහිත පුද්ගලයින් 75530 ක් ලේඛන පරික්ෂාව ( ElectionS පරිගණක වැඩසටහන) අනුව හඳුනාගත් අතර, එම තැනැත්තන්ට ද ස්ථාන (දිස්ත්‍රික්ක) දෙකටම ලිපි යොමු කරන ලදි, ඒ අනුව එම පුද්ගලයින්ගෙන් ලද ලිඛිත පිළිතුර පරිදි, එක් ස්ථානයකින් පමණක් ඡන්දය පාවිච්චි කිරීමට හැකිවන අයුරින්, ඡන්ද පොල වෙත ඡන්ද විමසීමේ කටයුතු සඳහා යොදා ගන්නාලද ඡන්ද හිමි නාමලේඛනයේ එක් ස්ථානයකින් (MR ලෙස සටහන් කර ) පමණක් ඡන්දය භාවිතා කිරීමට ඉඩ ලබා දෙන ලදි. ඡන්ද මධ්‍යස්ථානයට ලබා දෙන ලද නාමලේඛනවල MR ලෙස යොදා නිකුත් කර ඇත.

- ❖ එමෙන්ම මෙවැනි එකම ජාතික හැඳුනුම්පත් අංකයක් යටතේ බහුලියාපදිංචිය පිළිබඳ ලිපි අදාළ තැනැත්තක් වෙත යොමු කිරීම හේතුවෙන් අදාළ පුද්ගලයින්ගෙන් ලද තොරතුරු අනුව, එකම අංක සහිත ජාතික හැඳුනුම්පත් පුද්ගලයින් දෙදෙනකුට, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති බවට අනාවරණය වී ඇති අතර, සමහර තැනැත්තන්ගේ ජාතික හැඳුනුම්පත් අංක ElectionS පරිගණක වැඩසටහනට වැරදි ලෙස ඇතුළත් කිරීම හේතුවෙන් බහු ලියාපදිංචියක් බවට පෙන්නුම් කර ඇති බැවින්, මෙම අඩුපාඩු ඒ ඒ දිස්ත්‍රික් කාර්යාලය මඟින්, "බීසී" ආකෘතිය සමඟ පරික්ෂාකර ElectionS පරිගණක වැඩසටහනේ නිවැරදි කරවීමටත්, 2018 ප්‍රතිශෝධන කටයුතු සඳහා නිකුත් කිරීමට නියමිත "බීසී" ලදුපත් ද මෙම අඩුපාඩු නිවැරදි කර මුද්‍රණය කිරීමටත් මේවනවිටත් කටයුතු යොදා ඇත.

- ❖ තවද මෙම බහු ලියාපදිංචියට අදාළ තොරතුරු සංයුක්ත තැටිය මඟින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත ලබාදී ඇති බවත්, ඒ අනුව මේවනවිටත් බොහෝ තැනැත්තන්ගේ ජාතික හැඳුනුම්පත් නිවැරදි කිරීමට කටයුතු කර ඇති අතර, එම තැනැත්තන්ගේ ජාතික හැඳුනුම්පත් අංක ද 2018 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු සිදුකරන අවස්ථාවේදි යාවත්කාලීන කිරීමට කටයුතු යොදා ඇත.

- ❖ 2018 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ මූලික කටයුතු එනම්, 2018 වර්ෂයට අදාළ "බීසී" ආකෘති හා අනෙකුත් ආකෘතීන් මුද්‍රණය කර සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට මේවනවිටත් නිකුත් කර ඇති අතර, ඡන්ද හිමියන් ගණන් ගැනීමේ කටයුතු පිළිබඳ පොදු උපදෙස් ලිපියක් දිවයිනේ සියලුම ලියාපදිංචි /සහකාර ලියාපදිංචි කිරීමේ නිලධරයන් වෙත ද, දේශපාලන පක්ෂ නියෝජිතයින් පත්කිරීමට අදාළ පොදු උපදෙස් ලිපියක් සියලුම පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙත යවා ඇත.

- 2018 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අවස්ථාවේදී ඡන්ද මධ්‍යස්ථාන/ඡන්ද කොට්ඨාස සංයුතිය වෙනත් කිරිම පිළිබඳ යෝජනා විවිධ දේශපාලන පක්ෂවලින්/සිවිල් සංවිධානවලින්/ආගමික නායකයින්ගෙන් ලැබීම හේතුවෙන් 2018 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු සිදුකරන අවස්ථාවේදී මේ පිළිබඳව කරුණු පරික්ෂාකර ඡන්ද හිමියන් ලියාපදිංචි කිරිමේ පනතේ 9(3) වගන්තිය යටතේ යම් සංශෝධනයක් සිදු කිරිමට අවශ්‍ය නම් ඒ පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලයට ලබා දෙන ලෙස සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත දන්වා ඇත.

- 2018 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කාල සීමාව තුළ අදාළ ග්‍රාම නිලධාරි ස්ථාන මාරුවීම් අත්හිටුවීම සහ එම කාලය තුළ ග්‍රාම නිලධාරි කාර්යාල දින සීමා කිරීම පිළිබඳව, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවා ඇති අතර, එම ලිපියේ පිටපතක් දිවයිනේ සියලුම ලියාපදිංචි/සහකාර ලියාපදිංචි කිරිමේ නිලධරයන්/සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් මෙන්ම ග්‍රාම නිලධාරි වෘත්තිය සමිති නියෝජිතයින් වෙත ද යවා ඇත.

(iv) පළාත් සභා මන්ත්‍රීධුර පුරප්පාඩු පිරවීම.

2018 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ පළමු කාර්තුවට අදාළව පහත සඳහන් පළාත් සභා මන්ත්‍රීධුර පුරප්පාඩු මැතිවරණ කොමිෂන් සභාව විසින් පුරවන ලදී.

| පළාත් සභාව | පරිපාලන දිස්ත්‍රික්කය | පුරප්පාඩු වූ පළාත් සභා මන්ත්‍රී ධූරය දැරූ මන්ත්‍රීවරයාගේ නම | දේශපාලන පක්ෂය /ස්වාධීන කණ්ඩායම | පළාත් සභා ලේකම් විසින් දැනුම් දෙන ලද දිනය | පුරප්පාඩු වීමට හේතුව | තේරී පත් වූ මන්ත්‍රීවරයාගේ නම / ගන්නා ලද ක්‍රියා මාර්ගය | අදාළ ගැසට් පත්‍රයෙහි අංකය | අදාළ ගැසට් පත්‍රයෙහි දිනය |
|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | එස්. කුහවරදන් | එකමුතු ප්‍රගතිශීලී සංධානය | 2017.12.21 | ඉල්ලා අස්වීම | ස්ටැන්ලි ඇන්තනී සන්මුගම් | 2055/33 | 2018.01.24 |
| | කොළඹ | උස්වත්ත ලියනගේ සේනක දමයන්ත ද සිල්වා | එක්සත් ජාතික පක්ෂය | 2017.12.19 | ඉල්ලා අස්වීම | ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් | 2052/27 | 2018.01.05 |
| | ගම්පහ | ජයවීර ආරච්චිගේ රොයිස් විජිත ප්‍රනාන්දු | එක්සත් ජාතික පක්ෂය | 2017.12.18 | ඉල්ලා අස්වීම | සුදසිං මංචනායක අප්පුහාමිලාගේ කිත්සිරි මංචනායක | 2058/27 | 2018.02.14 |
| | ගම්පහ | මාදම්පෙ අප්පුහාමිලාගේ මංජුල ප්‍රසන්න සම්පත් | එක්සත් ජාතික පක්ෂය | 2017.12.12 | ඉල්ලා අස්වීම | උතුවන් පතිරන්නැහැලාගේ චන්ද්‍රසෝම සරණලාල් | 2055/33 | 2018.01.24 |
| උතුර | මන්නාරම | හබීබු මොහමදු රයීස් | ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය | 2017.12.05 | ඉල්ලා අස්වීම | අබ්දුල් නියාස් සීනි මොහමඩ් | 2055/34 | 2018.01.24 |
| | යාපනය | ඉම්මානුවල් ආනල්ඩ් | ඉලංකෙයි තමිල් අරසු කච්චි | 2017.12.14 | ඉල්ලා අස්වීම | සබාරත්නම් කුගදාස් | 2055/34 | 2018.01.24 |

## 8. මූල්‍ය ප්‍රතිපාදන

මැතිවරණ කොමිෂන් සභාවේ 2018 වර්ෂයේ පළමු වන කාර්තුවේ වියදම් සාරාංශය පහත දැක්වේ.

| විස්තරය | ප්‍රතිපාදන | මාරුකිරීම් /කපාහරින ලද ප්‍රතිපාදන | | | ශුද්ධ ප්‍රතිපාදන | පළමුවන කාර්තුවේ වියදම් | තැන්පතු/ වත්කම් |
|---|---|---|---|---|---|---|---|
| | | අතිරේක ප්‍රතිපාදන | එකතු කිරීම් | අඩු කිරීම් | | | |
| වැටුප් හා වේතන | 230,000,000 | | | | 230,000,000 | 55,589,784 | 174,410,216 |
| වැටුප් හා වේතන (21) | 3,000,000 | | | | 3,000,000 | 750,000 | 2,250,000 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 10,000,000 | | | | 10,000,000 | 7,639 | 9,992,361 |
| වෙනත් දීමනා | 170,000,000 | | | | 170,000,000 | 31,308,797 | 138,691,203 |
| ගමන් වියදම් - දේශීය | 5,000,000 | | | | 5,000,000 | 9,524 | 4,990,476 |
| ගමන් වියදම් - විදේශීය | 2,000,000 | | | | 2,000,000 | | 2,000,000 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 4,750,000 | | | | 4,750,000 | 155,760 | 4,594,240 |
| ඉන්ධන (කපාහැරීම් 15%) | 12,000,000 | | | | 12,000,000 | 1,110,609 | 10,889,391 |
| ආහාරපාන හා නිල ඇඳුම් | 500,000 | | | | 500,000 | 144,000 | 356,000 |
| වාහන | 12,000,000 | | | | 12,000,000 | 348,770 | 11,651,230 |
| යන්ත්‍ර හා උපකරණ | 8,000,000 | | | | 8,000,000 | 1,002,983 | 6,997,017 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 300,000 | | | | 300,000 | | 300,000 |
| ප්‍රවාහන (කපාහැරීම් 10%) | 7,000,000 | | | | 7,000,000 | 1,629,194 | 5,370,806 |
| තැපැල් හා සන්නිවේදන | 15,500,000 | | | | 15,500,000 | 2,804,227 | 12,695,773 |
| විදුලිය හා ජලය | 14,000,000 | | | | 14,000,000 | 3,029,561 | 10,970,439 |
| කුලී හා වරිපනම් ගාස්තු | 7,000,000 | | | | 7,000,000 | 1,685,535 | 5,314,465 |
| ලීසිං ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය | 5,900,000 | | | | 5,900,000 | | 5,900,000 |
| වෙනත් | 4,021,646,000 | | | | 4,021,646,000 | 1,276,440,229 | 4,418,559,771 |
| දේපළ ණය පොලී | 4,500,000 | | | | 4,500,000 | 1,020,040 | 3,479,960 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 30,000,000 | | | | 30,000,000 | 94,634 | 29,905,366 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 3,000,000 | | | | 3,000,000 | 15,193 | 2,984,807 |
| යන්ත්‍ර සහ උපකරණ | 26,250,000 | | | | 26,250,000 | 610,669 | 25,639,331 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 50,000,000 | | | | 50,000,000 | - | 50,000,000 |
| ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | 1,000,000 | | | | 1,000,000 | | 1,000,000 |
| පුහුණු හා ධාරිතා වර්ධනය | 4,000,000 | | | | 4,000,000 | 528,864 | 3,471,136 |
| | **4,532,946,000** | **-** | **-** | **-** | **4,537,746,000** | **126,972,790** | **4,942,413,988** |

## 9. 2018 වර්ෂයට අදාළ ඉදිරි කටයුතු

i. සිව් අවුරුදු උපාය මාර්ගික සැලැස්මට අනුව පිළියෙල කරන ලද 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාකිරීම.

ii. විශේෂ ව්‍යාපෘතිවල 2018 වර්ෂයට අදාළව සැලසුම් කළ කටයුතු ක්‍රියාත්මක කිරීම.

iii. 2018 ජුනි 01 දින ඡන්ද හිමියන්ගේ දිනය සැමරීම.

iv. 2018 ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු හා ඒ පිළිබඳව දැනුම්වත් කිරීම් සිදු කිරීම.

v. ඡන්දහිමියන් ලියාපදිංචි පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත ඇතුළු මැතිවරණ නීති සංශෝධනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vi. 2018 වර්ෂයේ පැවැත්වීමට නියමිත පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා පූර්ව කටයුතු සම්පූර්ණ වූ පසුව ඡන්ද විමසීම් පැවැත්වීමට ක්‍රියාකිරීම.

vii. දේශපාලන පක්ෂ අලුතින් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු සම්පූර්ණ කිරීම.

viii. 2018 වර්ෂයේ ජුනි 01ට පසුව වයස අවුරුදු 18 සම්පූර්ණ වන යෞවනයන්ගේ නම් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය නීති සම්පාදනය සඳහා කටයුතු කිරීම.

ix. පළාත් සභා ඡන්ද විමසීම් පනතේ සංශෝධන සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.

x. මැතිවරණ කොමිෂන් සභාව වෙත පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

ඉහතින් දක්වා ඇත්තේ 2018.01.01 දින සිට 2018.03.31 දින දක්වා වූ 2018 වර්ෂයේ පළමු වන කාර්තුවට අදාළ කාලය තුළ මැතිවරණ කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කටයුතු හා අනෙකුත් පරිපාලන හා කළමනාකරණ කටයුතු සඳහා වූ කාර්ය සාධනයේ විස්තරයකි.

**මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,**

**හේ.මු.ති.දි.හේරත්,** **2018.04.15**
ලේකම්,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.